00065

THE OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන -2011/2012
අවසාන පරීක්ෂණය -2013

**ESP 1111/2111 – අන්තර්කරණ අධ්‍යාපනය**

කාලය පැය තුනයි.

---

දිනය - 2013 නොවැම්බර් මස 03 වන දින වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද, දෙවන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටද, පිළිතුරු සපයන්න.

## I - වන කොටස

01. ඒකීයකරණ අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය අතර වෙනස්කම් 3 ක් පැහැදිලි කරන්න.

02. 'ලෝකයේ සමහර රටවල පාසලින් බැහැරව සිටින්නේ දුබලතා සහිත ළමයින් පමණක් නොවේ.'

    උක්ත ප්‍රකාශය උදාහරණ සහිතව විශ්ලේෂණය කරන්න.

03. ප්‍රධාන ඉගෙනුම් දුබලතා ප්‍රවර්ගයන් තුනක් (03) දක්වා එක් එක් ඉගෙනුම් දුබලතාවයට බලපාන හේතු එක බැගින් දක්වන්න.

04. අනුවර්ති චර්යාවන්ට අදාළ කුසලතා තුනක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

05. i. බුද්ධි ඵලය පිළිබඳ සම්මත ප්‍රමථ වක්‍රයෙහි අන්ත දෙකෙහි සිටින, තම උපරිම විභව්‍යතාව කරා යාමට විශේෂ සහායක් අවශ්‍ය ළමයින් ප්‍රවර්ග දෙක නම් කරන්න.

ii. උක්ත දක්වන ලද ප්‍රවර්ග දෙකට අයත් ළමයින් සංවර්ධනය කිරීම සඳහා මැදිහත්වීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

06. ඔබගේ පන්ති කාමරයට ඇතුළත් කර ඇති මස්තිෂ්ක ආඝාතය සහිත ළමයෙකු සඳහා ඔබ අධ්‍යාපනික සහයක් ලබා දෙන්නේ කෙසේ ද?

07. බුද්ධිමය දුබලතා සහිත සිසුන් අධ්‍යාපනය තුළදී පෙන්නුම් කරන සීමාකම් පහක් (05) පැහැදිලි කරන්න.

08. පාසලේ දී සිසුන් අසමත් බවෙහි අවදානමට හෙළන පරිසරය ආශ්‍රිත සාධක 3 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) අන්තර්කරණ අධ්‍යාපනයේ ප්‍රධාන මූලධර්ම 3ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) අන්තර්කරණයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට ඔබ ඔබේ සාම්ප්‍රදායික පන්ති කාමරය භෞතිකව, සාමාජියව සහ මනෝවිද්‍යාත්මක ව වෙනස් කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 14)

10. "ප්‍රාථමික දුබලතාවය සහිත ළමයින්ට ද්විතියික දුබලතාව ඇති කරවන්නේ ඔවුන්ගේ පරිසරය විසිනි."

උක්ත ප්‍රකාශය උදාහරණ සහිතව සනාථ කරන්න. (ලකුණු 20)

11. i. කථන හා භාෂණ අක්‍රමතා හතරක් (04 )පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. ඉන් කථන හා භාෂා අක්‍රමතා එකක් තෝරාගෙන එය අවම කිරීම සඳහා ඉගෙනුම් ක්‍රියාකාරකමක් යෝජනා කරන්න. (ලකුණු 12)

12. මීළඟ පාසල් වසරේ දී උග්‍ර දෘෂ්ටි ඌණතා සහිත සිසුවෙක් ඔබගේ පන්ති කාමරයට ඇතුළත් කිරීමට නියමිත යැයි සිතන්න.

i. මෙම උග්‍ර දෘෂ්ටි ඌණතා සහිත සිසුවාට ඉඩ සැලසීම සඳහා අවශ්‍ය විශේෂ උපකරණ හා සහායක සේවා මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. සාමාන්‍ය පන්ති කාමරයේ විෂයමාලාවට උග්‍ර දෘෂ්ටි ඌණතා සහිත සිසුවෙකුට ප්‍රවේශය සැළසීම අභියෝගාත්මක කාර්යයක් විය හැකිය."

උක්ත ප්‍රකාශය උදාහරණ සහිතව සනාථ කරන්න. (ලකුණු 12)

13. i. සාමාන්‍ය පන්ති කාමරය තුළ විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේදී කණ්ඩායම් ප්‍රවේශයක ඇති වැදගත්කම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. 'විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සංවර්ධනයෙහි ලා වඩා වළදායී සම්පත් දායකයින් වන්නේ ඔවුන්ගේ දෙමාපියන් ය.'

උක්ත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

14. පහත දක්වා ඇති ඕනෑම මාතෘකා දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

1. අවධාන ඌණතා අධික්‍රියාකාරී අක්‍රමතාවය.
2. සංවේදන ඌණතා සහිත සිසුන් සඳහා ක්‍රියාකාරී තක්සේරුකරණය
3. අන්තර්කරණ පන්ති කාමරයක් තුළ දී ගුරුවරුන් විසින් සංවර්ධනය කරගත යුතු විවිධාකාර ඉගැන්වීම් ක්‍රම
4. වර්තන දෝෂ

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.